# කම්මැලි පැංචා



කථාව : තිසුමි දිහන්සා ගංගොඩ

# හැඳින්වීම

කෘතියේ නම: කම්මැලි පැංචා.

කතෘගේ නම: තිසුමි දිහන්සා ගංගොඩ.

කතෘ අයිතිය : (කථාව සහ සිතුවම්)

තිසුමි දිහන්සා ගංගොඩ.

කෘතිය පළ කල දිනය : 2025.02.08

**ISBN අංකය: 978-624-208-416-9**

# පිදුම

මෙම කථාපොත ලිවීමට මා හට උපකාර කල මාගේ

අම්මාටත් පවුලේ සියළු දෙනා හා මාගේ ගුරු

මව්වරුන්ටත්  ආදරයෙන් මෙම පොත පුදකර සිටිමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ස්තූතිය.

මාහට අකුරු කියාදුන් මාගේ ආදරණීය ගුරුතුමියන් වන මොරින් විජේකෝන් ගුරුතුමියටත් දමයන්ති ගලපිටිය ගුරුතුමියටත් හා මෙම අවස්ථාව මා හට ලබාදුන් මාගේ පාසලේ විදුහල්පතිතුමියට මාගේ ප්‍රණාමය පුදකර සිටිමි.

එකෝමත් එක කාලෙක ඈත පිටිසර ගමක සිරිමල් කියලා පුංචි ළමයෙක් හිටියා.එයා හරිම කම්මැලියි.ඉතිං ගමේ හැමෝම එයාට කිවුවේ ''කම්මැළි පැංචා''කියලා.



එයා උදේට නැගිටින්න හරිම කම්මැලියි.එයාගේ අම්මා ටොෆි චොකලට් දීල තමයි සිරිමල්ව නැගිට්ටුවේ.

“සිරිමල්, සිරිමල් නැගිටින්න, නැගිටින්න දැන් හොඳටම පරක්කු වෙලා.ඇයි අද ඉස්කෝලේ යන්නේ නැද්ද?” අම්මා ඇහුවා.



“අම්මේ.. මට තව ටික්ක නිදාගන්න දෙන්නකෝ”

සිරිමල් කිවුවා. ඉතිං ටික දවසක් ගත වුනා. සිරිමල්ගේ

අම්මා සිරිමල්ට කථා කරලා මෙහෙම කිවුවා.



“පුතේ ඔයා ඔහොම කම්මැලි වෙන්න එපා.එහෙම වුනොත් පැරදෙන්න තමයි වෙන්නේ”

ඉතිං සිරිමල් අම්මා කියපු කිසිදෙයක් ඇහුවේ නෑ.හැමදාම ඉස්කෝලේ යනකොට පරක්කු වුනා.ගුරුවරුන් හැමදාම සිරිමල්ට බැන්නා.



ඉතිං සිරිමල්ගේ අම්මා කම්මැලිකමට හොඳ වැඩක් කරන්න ඕනේ කියලා හිතුවා. ඊට පස්සේ ඊළඟ දවසේ අම්මා සිරිමල්ව ඇහැරෙව්වේ නෑ. නැගිටින්න හොදටම පරක්කු වුනා. සිරිමල් හොදටම බය වුණා.ඉතින් සිරිමල් ඉක්මනින් ලෑස්තිවෙලා ඉස්කෝලෙට ආවා. ඉස්කොලේ පටන්ගෙන ගොඩක් වෙලා.



“අපොයි දෙවියනේ අදනම් හොඳටම පරක්කු වෙලා. දැන් ඉතින් බැනුම් අහන්නයි වෙන්නේ...දැන් ඉතින් මොකද කරන්නේ ....කමක් නෑ පන්තියට ගිහින් බලමු.”

සිරිමල් හොරෙන් පන්තියට ඇතුල් වුනා. එතකොටම ගුරුතුමිය සිරිමල්ව දැක්කා.



“සිරිමල් ඔහොම නවතින්නයි කිව්වේ……දැන් වෙලාව කීයද? හොඳටම දවල් වෙලා.මේක ඉස්කොලේ එන වෙලාවක්ද?”

එහෙම කියලා ගුරුතුමිය සිරිමල්ට හොඳටම බැන්නා.



දඩුවමකුත් දුන්නා.මුළු ඉස්කොලේ වටේම අතුගාන්න කිවුවා.සිරිමල් ලැජ්ජාවෙන් ඉඳල අරන් අතුගාන්න පටන් ගත්තා.එයාට හරිම මහන්සියි.යාළුවෝ හැමෝම එයාට හිනා වුණා.



සිරිමල්ට එයා කරපු වැරැද්ද තේරුම් ගියා.එයාට යාළුවෝ මෙහෙම කිවුවා.

ඔහොම කම්මැලි වුනොත් හැමදාම ලැජ්ජා වෙන්න තමයි වෙන්නේ.හැමදාම උදේම නැගිටලා මේ අපි වගේ ඉස්කෝලේ එන්න.අපි එකතු වෙලා වැඩ කරමු.කම්මැලියන්ට කව්රුත් කැමති නෑ.



යාළුවෝ මෙහෙම කියද්දී සිරිමල්ගේ කමුමල් දෙක රත් වුනා.සිරිමල්ට ගොඩක් ලැජ්ජාවක් වගේම දුකකුත් හිතුණා. ඉතින් එදා ඉදන් එහා හිතාගත්තා අයේ කවදාවත් කම්මැලි නොවී උදේම නැගිටලා අම්මටත් උදවු කරලා කලින්ම ඉස්කෝලේට ඇවිත් හොදට ඉගෙන ගන්නවා කියලා.



එදා ඉදන් කවමදාවත් සිරිමල් පරක්කු වෙලා ඉස්කොලේට ගියේ නෑ.සිරිමල් ගැන අම්මටත් හරිම සතුටුයි.අම්මා සිරිමල්ට කථාකරලා මෙහෙම කිවුවා.



“මගේ පුතා දැන් හරිම හොඳයි.උදේම නැගිටින කම්මැලි නැතුව අම්මටත් උදවු කරන හොඳ ළමයෙක් වෙලා.මට හරිම සතුටුයි.’’ ඉතිං යාළුවේ අපිත් සිරිමල් වගේ කම්මැලි නොවී වැඩ කරමු.මල් වගේ ලස්සන වෙමු.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිපිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිපිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,<br>
සෙනෙවිරත්න මහලේකම්